# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021

2023 ඔක්තෝබර්

සමාජීය විද්‍යා පීඨය

මානවවිද්‍යාව

**මානවවිද්‍යාව හැඳින්වීම ANTH 18214**

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. මානවවිද්‍යාව යනු කුමක්දැයි හඳුන්වා දී මානවවිද්‍යා විෂය හැදෑරීමේ වැදගත්කම පිළිබඳව ඔබගේ අදහස් දක්වන්න. (ලකුණු 20)

02. "සංස්කෘතිය" යනු කුමක්දැයි නිර්වචන <u>03 ක්</u> ඇසුරින් පැහැදිලි කොට සංස්කෘතිය අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ විමසන්න. (ලකුණු 20)

03. ප්‍රාග් නූතන සමාජයක කැපීපෙනෙන ලක්ෂණ පැහැදිලි කොට ශ්‍රී ලංකාවේ වෙසෙන ප්‍රාග් නූතන සමාජ අතුරින් ඔබ කැමති සමාජයක් පිළිබඳව ප්‍රාමාණික විස්තර කරන්න. (ලකුණු 20)

04. මානවවිද්‍යා කෞතුකාගාර යනුවෙන් හඳුනාගත හැක්කේ කුමක්දැයි පැහැදිලිකොට මානවවිද්‍යා කෞතුකාගාරයක කාර්යභාරය පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20)

05. <u>දෘශ්‍ය මාධ්‍ය</u> යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්දැයි පැහැදිලි කොට මානවවිද්‍යා පර්යේෂණ කටයුතු සඳහා භාවිත කරන <u>බහුමාධ්‍ය</u> (multimedia) මෙවලම් පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 20)

06. ඔබ විසින් තෝරාගත් යම් ස්ථානයක (උදා. නිවස/කාර්යාලය) භාවිතාවන ද්‍රව්‍යාත්මක සංස්කෘතිය පිළිබඳ අවධානය යොමුකරමින් ඒවා භාවිත කරන පුද්ගලයින් පිළිබඳ කිව හැක්කේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 20)

07. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ක්‍රීඩා සමග බැඳි විශ්වාස හා මතිමතාන්තර පිළිබඳව මානවවිද්‍යාත්මක විමර්ශනයක් සිදු කරන්න. (ලකුණු 20)

08. මෙරට ආහාර සංස්කෘතිය තුළ දැකිය හැකි ආහාර සකස් කිරීමේ සාම්ප්‍රදායික ක්‍රමවේද මොනවාදැයි විමසීමක් කොට එය මානවවිද්‍යාව හදාරන්නෙකුට කොපමණ දුරට වැදගත් වන්නේ දැයි පෙන්වා දෙන්න. (ලකුණු 20)

********************************